# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.17 පැය 0610 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/753/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

**01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මට්ටක්කුලිය පොලිස් ස්ථානය.**

2025.04.16 වන දින රාත්‍රී කාලයේ මට්ටක්කුලිය පොලිස් වසමේ සුමිත්පුර ප්‍රදේශයේදී මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 50 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 44 ක් වන සුමිත්පුර, මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2025.04.16 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ කහවිට ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 460 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 22 ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.**

2025.04.16 වන දින දහවල් කාලයේ මොරටුව පොලිස් වසමේ මුරවත්ත වෙරළ තීරයේදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 950 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 53 ක් වන මොරටුවැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරටුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - මට්ටක්කුලිය පොලිස් ස්ථානය.**

2025.04.16 වන දින රාත්‍රී කාලයේ මට්ටක්කුලිය පොලිස් වසමේ සුමිත්පුර ප්‍රදේශයේදී මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 402 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකාරිය වයස අවුරුදු 51 ක් වන සුමිත්පුර, මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මට්ටක්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. නීති විරෝධී මත්පැන් සහ ගෝඩා සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාස.

වැඩ බලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කරගෙන යනු ලබන අපාරධ සහ මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව 2025.04.16 වන දින උදෑසන කාලයේ රාගම පොලිස් වසමේ පොඩිවී කුඹුර වගුරුබිම් ප්‍රදේශයේදී බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 375 (බූලි 10), නීති විරෝධි මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 8100 (බැරල් 40) හා තඹ දගර 05 ක් සමඟ සැකකරුවන් තිදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 23 සහ 32 වයස්වල පසුවන රාගම සහ වැලිසර ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොඩිගාමම් පොලිස් ස්ථානය.

2025.04.16 වන දින සවස් කාලයේ කොඩිගාමම් පොලිස් වසමේ ඉඩයකුරිච්චි ප්‍රදේශයේදී කොඩිගාමම් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 64 ක් වන ඉඩයකුරිච්චි නැගෙනහිර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොඩිගාමම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - බණ්ඩාරගම පොලිස් වසම.

2025.04.16 වන දින රාත්‍රී කාලයේ බණ්ඩාරගම පොලිස් වසමේ බණ්ඩාරගම කැස්බෑව මාගර්යේ වැල්මිල්ල ප්‍රදේශයේදී බණ්ඩාරගම දෙස සිට කැස්බෑව දෙසට ධාවනය වූ යතුරුපැදියක් ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි තවත් යතුරු පැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ එක් පැදිකරුවෙකු බණ්ඩාරගම රෝහලට ඇතුලත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා පානදුර රෝහල වෙත ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති අතර අනෙක් පැදිකරු තුවාල ලබා හොරණ රෝහලට ඇතුලත් කර නේවාසිකව ප්‍රතිකාර ලබයි.

**මරණකරු වයස අවුරුදු 51 ක් වූ අලුත්ගම, බණ්ඩාරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පානදුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බණ්ඩාරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**